කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2017

පළමු සෙමෙස්තර අවසානය

**ECN 2120 / ENH 2111 : මානව සම්පත් කළමනාකරණ ආර්ථික විද්‍යාව**

කාලය: පැය දෙක (02) යි.

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1).

i. මානව ප්‍රාග්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 08)

ii. මානව ප්‍රාග්ධන සම්පාදනයේ වැදගත්කම ඓතිහාසික, ආර්ථික හා සමාජීය පැතිකඩ පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 17)

2).

i. ආයතනයක අනාගත මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීම සඳහා බලපාන සාධක මොනවාද? (ලකුණු 10)

ii. "පුරෝකථනය කරන ලද මානව සම්පත් ඉල්ලුම, තක්සේරු කරන ලද මානව සම්පත් සැපයුම සමඟ සැසඳීමෙන් පසුව ගතයුතු අවශ්‍ය උපක්‍රම නිශ්චය කළ යුතුය". මෙම ප්‍රකාශය විභාග කරන්න. (ලකුණු 15)

3).

i. ආකර්ෂණය (Recruitment), තෝරා ගැනීම (Selection) හා බඳවා ගැනීම (Hiring) යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. "ආකර්ෂණය (Recruitment) සඳහා බලපාන සාධක පිළිබඳව සාර්ථක මානව සම්පත් කළමනාකරුවෙකු සංවේදී විය යුත්තේ ඒවා සේවකයන් ආකර්ෂණය කර ගැනීමේදී සංරෝධනයන් (constraints) විය හැකි බැවිනි." සාකච්ඡා කරන්න, (ලකුණු 17)

4).

i. සාර්ථක සේවකයින් තෝරා ගැනීමක් සඳහා බලපාන යෙදවුම් හා අවශ්‍යතා (**inputs and requirements**) මොනවාද? (ලකුණු 10)

i. "නිශ්චිත රැකියාවක් සඳහා ගැලපෙන හොඳම පුද්ගලයා සොයා ගැනීමේ අරමුණින් පුද්ගලයින් දෙදෙනෙකු අතර නිදහසේ කොරතුරු හුවමාරු කර ගැනීමේ මූලික සමාජ අවස්ථාවක් ලෙස සම්මුඛ පරීක්ෂණ හැඳින්විය හැකිය." ඉහත කියමන පිළිබඳ අදහස් දක්වන්න.

(ලකුණු 15)

5).

කිසියම් සේවක වර්ගයක් වෙනුවෙන් අනුස්ථාපන වැඩසටහනක් සැකසීමට, පැවැත්වීමට හා ඇගයීමට ඔබට සිදු වී ඇතැයි සිතන්න. මේ සම්බන්ධයෙන් ඔබ ක්‍රියාකරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 25)

6).

"සේවක කාර්යසාධනය ඇගයීමේ සමස්ත ප්‍රයෝජනය වනුයේ මානව සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගෙන ආයතනයේ කාර්යක්ෂමතාව හා සඵලත්වය ඉහළ නංවාගැනීමයි." ඉහත කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 25)

7). පහත සඳහන් මාතෘකා අතරින් ඔබ කැමති <u>හතරක්</u> (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(එකකට ලකුණු 6.25 බැගින්)

i. රැකියා නිර්මාණ මූලිකාංග

ii. සේවක අනුස්ථාපනයේ ප්‍රතිලාභ

iii. රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය

iv. අරමුණු අනුව කළමනාකරණය. (එම්.බී.ඕ.)

v. ඉගෙනුම් චක්‍ර

vi. ඇගයීම් මධ්‍යස්ථානයන්ගේ වැදගත්කම

vii. කාර්යසාධන නිර්ණායක හා ප්‍රමිති

*************